# " සංවේදී සිදුවීම් වාර්තා කිරීම"




ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් මෙවර ලෝක ජනමාධ්‍ය නිදහස් දිනය වෙනුවෙන් සංවිධානය කළ, "සංවේදී සිදුවීම් වාර්තා කිරීම" යන මැයෙන් විද්වත් සාකච්ඡාවක් පසුගිය මැයි 03 දිනදී ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේදී පැවැත්වුණි.

මෙම සාකච්චාවේ අදහස් දැක්වීම සඳහා හනා ඉබ්‍රහිම් මිය, ඩේලි සහ සතිඅන්ත එක්ස්ප්‍රස් පුවත්පත් කර්තෘතුමිය, රත්මලාන වෘතිය පුහුණු උපදේශකයෙකු වන එම්.ජේ.ආර් ඩේවිඩ් මහතා, බ්ලොග් අඩවි සහ සමාජ ක්‍රියාකාරිකයෙකු වන අජිත් පැරකුම් මහතා,ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ පැමිණිලි නිලධාරී කමල් ලියනාරච්චි මහතා සහභාගී වූ අතර මෙහෙයවීම කරනු ලැබුවේ ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලයේ ප්‍රධානි ශාන් විජේතුංග මහතා විසිනි.

ශ්‍රී ලංකාවේ පවතින වර්තමාන තත්ත්වය හමුවේ ජනමාධ්‍ය වගකීමෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාවය එහිදී අවධාරණයට ලක්විය. ජනමාධ්‍ය ආචාරධර්මයන්ට අනුව නිවැරදිව, සමබරව, සහ වගකීමෙන් යුතුව වාර්තා කිරීමෙන් අදාළ සිදුවීමෙන් බලපෑමට හා පීඩාවට පත්වූ ප්‍රජාව තව දුරටත් කම්පනයට පත් කරවන හා ආතතිය වැඩිවන ආකාරයෙන් වාර්තා නොකිරීමේ වැදගත්කමද එහිදී අවධාරණය කෙරිණි.

මාධ්‍යවේදීන් සහ සිවිල් සමාජ ද මේ සඳහා සහභාගීවිය.



සාකච්ඡාව සඳහා සහභාගිවූවන් පිරිසක්